මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ ලේකම් කාර්යාලය, අංක 02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல. 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**LAE/2025/101**

2025.05.23

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025 මැයි 06

### 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ විධිවිධාන

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා තරග වැදුනු සියලුම අපේක්ෂකයන්, අපේක්ෂකයන් නියෝජනය කරන ලද පක්ෂවල ලේකම්වරුන් සහ ස්වාධීන කණ්ඩායම් නායකයන් විසින් 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත ප්‍රකාරව තම මැතිවරණ ප්‍රචාරණ ආදායම් වියදම් වාර්තා වෙන වෙනම සකස් කර 2025.05.27 වන දින මධ්‍යම රාත්‍රී 12:00 ට හෝ ඊට ප්‍රථම ඒ ඒ අපේක්ෂකයින්, අපේක්ෂකයන් නියෝජනය කරන ලද පක්ෂවල ලේකම්වරුන් සහ ස්වාධීන කණ්ඩායම් නායකයන් තරග කළ පළාත් පාලන ආයතනයන්හි තේරීම්භාර නිලධාරීන් වෙත භාර දිය යුතු වේ.

එලෙස තම මැතිවරණ ප්‍රචාරණ ආදායම් වියදම් වාර්තා භාරදෙනු ලබන අපේක්ෂකයින්ගේ, අපේක්ෂකයන් නියෝජනය කරන ලද පක්ෂවල ලේකම්වරුන්ගේ හා ස්වාධීන කණ්ඩායම් නායකයන්ගේ පහසුව උදෙසා මැතිවරණ කොමිෂන් සභාව විසින් හඳුන්වාදෙන ලද https://cf.elections.gov.lk/ වෙබ් සබැඳිය වෙත පිවිස ලියාපදිංචි වීමෙන් අනතුරුව එම වෙබ් අඩවිය වෙත තම මැතිවරණ ප්‍රචාරණ ආදායම් වියදම් වාර්තා උඩුගත කිරීමට හැකිවන පරිදි පහසුකම් සපයා ඇත.

එසේම මෙම කාලය තුළ මැතිවරණ ප්‍රචාරණ ආදායම් වියදම් වාර්තා ගෙනවිත් භාරදිය නොහැකි නම්, අදාළ වාර්තා 2025.05.27 දිනට පෙර අපේක්ෂකයින්, අපේක්ෂකයන් නියෝජනය කරන ලද පක්ෂවල ලේකම්වරුන් සහ ස්වාධීන කණ්ඩායම් නායකයන් තරඟ කළ පළාත් පාලන ආයතනයන්හි තේරීම්භාර නිලධාරීට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීමටද අවස්ථාව ඇත.

2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 8(අ) වගන්තිය ප්‍රකාරව, 2025.05.27 වන දින මධ්‍යම රාත්‍රී 12:00 ට හෝ ඊට ප්‍රථම මැතිවරණ වියදම් වාර්තා භාර නොදීම තුළින් නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් සිදු කරන අතර ඒ පිළිබඳව මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතට අනුකූලව නීත්‍යානුකූලව කටයුතු කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්